**සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2023**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** මතය

සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මූල්‍ය ප්‍රකාශන තුලින් විධිවිධානය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15(2) වගන්තිය | යම් දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වි ඇති විට මණ්ඩලය විසින් එම දායකයාට දැන්වීමක් නිකුත් කළ යුතු වුවත් සාමාජිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය තුළින් වාර්තා ලබාගැනීමට නොහැකි වීම මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 717,928 ක් වූ අක්‍රිය තත්ත්වයට පැවති දායකයින්ට ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දැනුම් දී නොතිබුණි. | අක්‍රිය නිවේදන නිකුත්කිරීම සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අක්‍රිය වී ප්‍රතිලාභ අහිමි වූ සාමාජිකයන් දැනුවත් කර, විශ්‍රාම පතිලාභ අහිමි වීම වැලැක්වීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,575,183 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.419,422 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,994,605 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුද්ගලික පඩිනඩි වියදම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ ආදායම්, වියදම් සහ අතිරික්තය සහ ඒවායේ ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව වර්ධනය හා පිරිහීම් පරීක්ෂාවේදී අරමුදලේ ආදායම සාමාජිකයන්ගේ දායක මුදලින් හා ආයෝජන පොළී යන ආදායම් වලින් සමන්විත වූ අතර පසුගිය හා සමාලෝචිත වර්ෂ වල බැංකු වල ස්ථාවර තැන්පතු පොළී අනුපාත අධික ලෙස ඉහළ යෑම හේතුවෙන් පොළී ආදායම වැඩි වී අරමුදලේ ආදායම වැඩි වීම සිදුවී තිබුණි. නමුත් එය දිගු කාලීනව බලාපොරොත්තු විය නොහැකි අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයන්ගේ දායක මුදල, වියදමට සාපේක්ෂව වර්ධනය කර ගැනීම අඩු මට්ටමක පවතින බැවින් මෙම තත්වය සාමාජිකයන්ට ගෙවීම් හා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර ලෙස බලපා තිබුණි. | 2019 සිට සමාලෝචිත වර්ෂය දක්වා සාමාජිකයන් බඳවාගැනීමේදී අයකරන මුල් වාරික මුදල අඛණ්ඩව වර්ධනය කර ඇති අතර පසුවාරික අයකිරීම වර්ධනය කිරීමටද සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතින බව. | විශ්‍රාම වැටුප් අරමුදලේ අරමුණු අනුව කටයුතු යුතුය. |
| (ආ) | සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2017 වර්ෂයේදී රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන 2018 දෙසැම්බර් 06 වන දින අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව රු: 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් ගත කාලය 2019 අගෝස්තු 06 දිනෙන් අවසන් වුවද, වැඩ ප්‍රමාද වීම හේතුවෙන් සැපයුම්කාර ආයතනය විසින් රු.මි. 12 ක අතිරේක මුදලක් වෙළඳපොළ මිල වෙනස්වීම් මත ඉල්ලා තිබූ අතර එම මුදල ආයතනයට ලබාදීමට ප්‍රතිපාදන නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ ජූනි 16 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් ගිවිසුම අවසන් කිරීමට තීරණය කර තිබුණද ඒ අනුව කාර්යසාධන ඇපකරය පසුගිය වර්ෂයේ ජූලි 01 දිනෙන් පසු කාලය දීර්ඝ | රු.මි. 12ක අතිරේක මුදලක් ඉල්ලා සිටි බැවින් එම ගිවිසුම අවසන් කිරීමට දෙපාර්ශවය එකඟ වූ අතර නව සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර ඇත. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම තුළින් ඒ මුදල මිලියන 17ක් බවට එම මුදල පත් වී ඇති අතර එම මුදල් භාවිතා කර නවීන පරිගණක පද්ධතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් වැය කරන ලද රු. 1,090,250 ක මුදල අය කර ගත නොහැකිව වසර 4 කාලයක සිට නිශ්ඵල වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වි තිබුණි. පද්ධතිය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු. 17,129,263ක් විය. | | |
| (ඇ) | තිලිණ, ඉසුර ,සරණ, ධන ලක්ෂ්මි, සුරුකුම සහ ආරස්සාව යනාදි වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07 ක් මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සුරුකුම හා ආරස්සාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02 පමණක් ක්‍රියාත්මකව පැවතුණි. සහන, සරණ, තිලිණ,ධන ලක්ෂ්මි යෝජනා ක්‍රම සඳහා බඳවාගත් 355,504 ක් වූ සාමාජිකයන් අතරින් සියයට 81 ක් එනම් 289,356 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රීය වි තිබුණ අතර ක්‍රියාත්මක වන සුරුකුම, ආරස්සාව හා ඉසුර විශ්‍රාම වැටුප් යොජනා ක්‍රම සඳහා බඳවාගත් 646,289 හි සාමාජිකයන් අතරින් සියයට 66 එනම් 428,572 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රීය වි තිබුණි. | අක්‍රිය සාමාජිකයන් එම යෝජනා ක්‍රමවලම සක්‍රිය කිරීමද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පදනම්කොටගෙන අත්හිටුවන ලදී. රජයේ දායකත්වය නොලැබීම හේතුවෙන් මෙම යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් එම සාමාජිකයන්ට, ආයතනයට සහ රජයට මුහුණපෑමට සිදුවන ගැටළු අවම කරගැනීමට මෙම තීරණය ගෙන ඇති බව. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සැලසුම් කිරීමේදී අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ. |
| (ඈ) | අක්‍රීය සාමජිකයන් සක්‍රීය කිරිමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 4.6 ක මුදලක් වෙන්කර තිබූ අතර ඒ මගින් අක්‍රීය සාමාජිකයින් 8000 ක් සක්‍රීය කිරීමටත් සක්‍රීය කිරිම මත එකතු කළ යුතු වාරික මුදල් මිලියන 80 ක් දක්වා එකතු කිරීම අපේක්ෂා කලද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 586,000 ක් වියදම් දරා සාමාජිකයින් 2724 දෙනෙකු සඳහා වාරික නොගෙවීම් පිළිබඳ ලිපි මඟින් දැනුම් දීමත් “ආරස්සාව“ විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයින් 23,745 කගෙන් සාමාජිකයින් 489 ක් නැවත සක්‍රීය කිරිම පමණක් සිදුකර තිබුණි. ඒ අනුව අපේක්ෂා කල පරිදි අක්‍රීය | සමාලෝචිත දින වන විට රු. 500,856.68 ක පිරිවැයක් පමණක් දරමින් දායකයින් 725ක් සක්‍රිය කර රු. 7,433,284.81ක මුදලක් රැස්කිරීමට මුදල් අංශයට හැකියාව ලැබී ඇති අතර දායකයින් 3267 සඳහා දැනුවත් කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇති බව. | ඉතිරි ප්‍රතිපාදන ද උපයෝජනය කර අක්‍රීයවූ දායකයන් සක්‍රීය කිරීම වෙනුවෙන් කඩිනම් හා කාර්යක්ෂම ලෙස පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාමාජිකයන්ගේ සක්‍රීය කිරිමේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නොහැකි වි තිබුණි. | | |
| (ඉ) | මණ්ඩලය විසින් 2017 වර්ෂයේදි ආරම්භ කර තිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු. මිලියන 94 ක මුදලක් ලබා දී තිබුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු. මිලියන 167 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. නමුත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2017-2022 කාලය තුල සාමාජිකයින් 509 ක් බඳවා ගෙන ඉන් 335 ක් අක්‍රීය වී ඇති අතර සමාලෝචිත වර්ෂයේ සාමාජිකයින් 361 ක් බඳවාගෙන සාමාජිකයන් 51 ක් අක්‍රීය වි තිබුණි. ඒ අනුව කලාකරුවන් වෙනුවෙන් ලැබුණ මුදල අදාල කාර්යය සඳහා නිසි පරිදි යෙදවීමට නොහැකිව තිබුණි. | කලාකරුවන් දායකත්වයක් යටතේ විශ්‍රාම වැටුපක් ලබාගැනීමට අකමැතිවීම හා ඔවුන් රජයෙන් නොමිලේ විශ්‍රාම වැටුපක් අපේක්ෂා කරන බැවින්, තවදුරටත් කලාකරුවන්ට ගෙවීමට වන වාරිකය අඩුකරමින් සකස් කිරීමට සාකච්ඡා වූ බව. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කලාකරුවන් බඳවා ගැනීමේ කටයුතු විධිමත් කර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සමස්ථ කලාකරුවන් වෙත ලබා දීමට කටයුතු ක්‍රියාත්මක කල යුතුය. |